# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

9 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2යි

### I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

1) සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූ ස්ථානය වන්නේ
   i. බුද්ධගයාව ii. ලුම්බිණි සල් උයන
   iii. උපවත්තන සල් උයන iv. ජීවක අඹ වනය

2) බුදුරජාණන් වහන්සේගේ ආකර්ශනීය වාග් විලාසය වර්ණනා කරනු ලැබුවේ
   i. කොසොල් රජතුමා ii. බිම්බිසාර රජතුමා
   iii. නන්ද තෙරුන් iv. අනේපිඬු සිටුතුමා

3) අධි ශීල, අධිචිත්ත, අධි ප්‍රඥාවෙන් යුක්ත ඍජු ප්‍රතිපත්තියෙහි යෙදෙන බැවින් මහා සංඝරත්නය
   i. සුපටිපන්න නම් වේ ii. උජුපටිපන්න නම් වේ
   iii. ආහුනෙය්‍ය නම් වේ iv. පාහුනෙය්‍ය නම් වේ

4) අටමස්ථානවලට අයත් වන සොළොස්මස්ථානවලට අයත් නොවන පූජනීය ස්ථානයක් වනුයේ
   i. ලංකාරාමය ii. ථූපාරාමය
   iii. මිරිසවැටිය iv. රුවන්වැලිසෑය

5) බුද්ධ මාතා යන ගරු නාමයෙන් හඳුන්වාදෙන ලද්දේ
   i. යශෝදරා දේවිය ii. මහාමායා දේවිය
   iii. ප්‍රජාපතීගෝතමී දේවිය iv. විශාඛා සිටුදේවිය

6) සිව් බඹ විහරණවලට අයත් වේ.
   i. සීලය ii. මෙත්තා iii. කය iv. සිත

7) සිඟාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය - සේවක සමාජ කණ්ඩායම දක්වා ඇති දිශාව වන්නේ
   i. උඩ දිශාව ii. යට දිශාව
   iii. උතුරු දිශාව iv. දකුණු දිශාව

8) බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහනායක හිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් වන්නේ
   i. බුදු සිරිත ii. දිව්‍යාවදානය
   iii. සාරාර්ථ සංග්‍රහය iv. සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය

9) අසීමිත ආශාවන්ගෙන් තොරව, ලද දෙයින් සතුටු වීමේ ගුණය හැඳින්වෙන්නේ

i. "සුභරෝ" යනුවෙනි
ii. "සන්තුස්සක" යනුවෙනි
iii. "අප්පකිච්ච" යනුවෙනි
iv. "නිපක" යනුවෙනි

10) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය වන දම්සක් පැවතුම් සූත්‍රයෙහි අන්තර්ගත වන්නේ

i. චතුරාර්ය සත්‍යය
ii. පටිච්ඡ සමුප්පාදය
iii. කර්මය
iv. ත්‍රිලක්ෂණය

11) ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව නොකළ යුතු වෙළඳාම් වලින් වෙන්ව යහපත් ජීවන වෘත්තියක යෙදීම

i. සම්මා වායාමයයි
ii. සම්මා කම්මන්තයයි
iii. සම්මා ආජීවයයි
iv. සම්මා දිට්ඨියයි

12) මෙලොව පරලොව දියුණුව මෙන්ම නිවන් අරමුණ ද සපුරා ගැනීම සඳහා සදුපදේශ සපයන බෞද්ධයාගේ අත්පොත වන්නේ

i. මහාවංශයයි
ii. ත්‍රිපිටකයයි
iii. ධම්ම පදයයි
iv. ජාතක පොතයි

13) පාලි පද්‍ය අනුසාරයෙන් ඉදිරිපත් කොට ඇති ධම්මපදයෙහි අඩංගු ගාථා ගණන

i. 432 කි
ii. 421 කි
iii. 26 කි
iv. 423 කි

14) අංශ තුනකින් හෙවත් තුන් ආකාරයකින් සීලය ආරක්ෂා කිරීම නම්,

i. ත්‍රිකෝටික පාරිශුද්ධියයි
ii. ත්‍රිලක්ෂණයයි
iii. ත්‍රිශික්ෂාවයි
iv. ත්‍රිවිද්‍යාවයි

15) "පුට්ඨස්ස ලෝක ධම්මේහි" මෙහි ලෝක ධම්ම යනුවෙන් සඳහන් වන්නේ

i. අටලෝ දහමයි
ii. ත්‍රිලක්ෂණයයි
iii. පටිච්ඡසමුප්පාදයයි
iv. මැදුම් පිළිවෙතයි

16) සසර දුක ඇතිවීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ

i. භය
ii. ලජ්ජාව
iii. තණ්හාව
iv. ක්‍රෝධය

17) ගමක මුදුන්මල්කඩ ලෙස සැලකෙන්නේ

i. දාගැබ
ii. වැව
iii. පන්සල
iv. පාසල

18) භද්දකච්චායනා තෙරණිය හඳුන්වන වෙනත් නමක් වන්නේ

i. මහාමායා තෙරණිය
ii. ප්‍රජාපතී ගෝතමී තෙරණිය
iii. බුද්ධ මාතා
iv. රාහුල මාතා

19) භික්ෂුණී ශාසනය ආරම්භ වූයේ බුද්ධත්වයෙන් වසර

i. පහකට පසුවය
ii. හයකට පසුවය
iii. හතකට පසුවය
iv. දහයකට පසුවය

20) ඔබ අතින් කිසිදු වරදක් නොවී ඔබට බැණුම් (නින්ද) ඇසීමට සිදුවන අවස්ථාවකදී ඔබ කළයුතු වන්නේ

i. කලබල නොවීම
ii. කෝප නොගැනීම
iii. ඉවසා දරා ගැනීම
iv. ඉහත සියලු ආකාරයෙන්ම කටයුතු කිරීම

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළත්ව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද ඉතිරි ප්‍රශ්න 4ට ලකුණු 10 බැගින් ලකුණු 40ක් ද හිමිවේ. ඒ අනුව II පත්‍රයට ලකුණු 60 කි.**

---

01) පාසල් පාදක තක්සේරුකරණයට අදාළව ඔබ පන්ති කාමරය තුළදී සිදුකරන ලද ඇගයීම ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ පන්ති කාමරයේදී සිදුකළ ඇගයීමට මාතෘකා වූ පෙළපොතෙහි පාඩම කුමක්ද?

ii. මෙම ඇගයීම සිදුකිරීමට පෙර ගුරුතුමාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.

iii. විවාද වැඩසටහන තුළදී ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාව කුමක්ද?

iv. එම ඇගයීම තුළදී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.

v. විවාද වැඩසටහන තුළින් ඔබ ලද අත්දැකීම් දෙකක් ලියන්න.

vi. දුක්ඛ නිරෝධාර්ය සත්‍ය මගින් උගන්වන සියලු දුක් නැතිකිරීමෙන් ලබන පරම සුවය කුමක්ද?

vii. අල්පේච්ඡ සරල ජීවිතයක් ගත කරන පුද්ගලයෙකු සතු ලක්ෂණ දෙකක් ලියන්න.

viii. නිවන හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

ix. මහිච්ඡතාව යනු කුමක්ද?

x. "නිබ්බාන පරමං සුඛං" යන්නෙහි අදහස ලියන්න.

(ලකුණු 2x10=20)

02) මිනිස් දිවිය උසස් කිරීමට මඟ පෙන්වන ඉගැන්වීමකි, සිව්බඹ විහරණ

i. සිව්බඹ විහරණ නම් කරන්න. (ල 2)

ii. එම ගුණාංග අතරින් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 3)

iii. මෙම සිව්බඹ විහරණ ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ල 5)

03) නිර්වාණගාමී ප්‍රතිපදාවේ පදනම සීලයයි.

i. මිනිසා සිල්වත් ජීවිතයකට යොමු කරන ලෝක පාලන ධර්මතා දෙක නම් කරන්න. (ල 2)

ii. අත්තූපනායික ධර්මය යනු කුමක්දැයි පහදන්න. (ල 3)

iii. ප්‍රාණඝාතයෙන් වැළකීමේ වටිනාකම ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය ඇසුරින් පැහැදිලි කරන්න. (ල 5)

04) පින් කැමති බෞද්ධයාට වපුරා අස්වැන්න නෙලාගත හැකි පින්කෙත නම් මහා සංඝරත්නයයි.

i. මහා සංඝරත්නය උදෙසා යුතුකම් ඉටුකළ යුතු ආකාරය පෙන්වා දෙන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද? (ල 2)

ii. සිව්පසය නම් කරන්න. (ල 3)

iii. ගිහියන් වන අප විසින් මහා සංඝරත්නය උදෙසා යුතුකම් ඉටුකළ යුතු ආකාරය පෙන්වා දෙන්න. (ල 5)

05) කර්මය බුදු දහමේ මූලික ඉගැන්වීමකි.

i. බුදු දහමට අනුව කර්මය යනු කුමක්ද? (ල 2)

ii. අකුසල මූල මොනවාද? (ල 3)

iii. දස අකුසල කර්ම ලියා දක්වන්න. (ල 5)

06) සත්ත්වයා සසර දුක්විඳින බවත්, එම දුක් විඳීමට හේතුවක් ඇති බවත් එය නැතිකළ හැකි බවත් බුදුරජාණන් වහන්සේ ලොවට දේශනා කළ සේක.

i. ඒ අනුව බුදුරජාණන් වහන්සේ දුක නැතිකිරීමේ මාර්ගය ලෙස පෙන්වා දුන්නේ කුමක්ද? (ල 2)

ii. බුදුරජාණන් වහන්සේ විසින් වදළ අත්හළ යුතු අන්ත දෙක ලියන්න. (ල 3)

iii. ආර්ය අෂ්ටාංගික මාර්ගය ලියා එය ත්‍රිශික්ෂාවට බෙද දක්වන්න. (ල 5)